**සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදල - 2020**

**---------------------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වා ගෙනයාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන**

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් අරමුදල විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.5.2 ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 57 ඡේදය ප්‍රකාරව, දේපල අයිතමයක මුළු පිරිවැය හා සසඳන විට සැලකිය යුතු පිරිවැයකින් සමන්විත එම අයිතමයේ කොටස් සෑම එකක්ම වෙන් වෙන්ව හඳුනාගත යුතු වේ. නමුත් මුළු පිරිවැය රු.126,255,800 ක්වූ නිලාවේලී පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිල්ල සහිත අක්කර 7 පර්චස් 37 ක ඉඩම, ඉඩම් හා ගොඩනැඟිලි වශයෙන් වෙන් වෙන්ව හඳුනාගෙන නොතිබීම හේතුවෙන් ගොඩනැඟිලි ක්ෂය වටිනාකම ගණනය කර ගිණුම් ගත කර නොතිබුණි. | නිලාවේලි පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිල්ල සහ ඉඩම වෙන් වෙන් වශයෙන් දැනට තක්සේරු කොට නොමැති බැවින් එය ඉදිරියේදී වෙන් වෙන් වශයෙන් තක්සේරු කර ක්ෂය කිරීම් ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව ගිණුම් පිළියෙල කළ යුතුය |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නව පවුල් ලක්ෂ 6 කට සහනාධාර ලබාදීමේදී සමෘද්ධි හිමිකම් සහතිකපත් මුද්‍රණය කිරීමට හා උත්සව වියදම් වෙනුවෙන් 2019 වර්ෂයේදී අරමුදලින් වැයකරන ලද රු. 113,074,862 ක් බැංකු මූල්‍ය අංශයෙන් ප්‍රතිපූරණය කර ගත යුතු වුවද එය ලැබිය යුතු මුදල් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2019 වර්ෂයේ නව පවුල් ලක්ෂ 06 කට සමෘද්ධි සහනාධාර හිමිකම් ලබාදීම සඳහා දරණ ලද වියදම් බැංකු අංශයෙන් ප්‍රතිපූර්ණය කරගැනීම සඳහා භාරකාර මණ්ඩලයේ උපදෙස් පරිදි අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2015 වර්ෂයේ සිට පැවත එන වැඩිපුර ලැබුණු රක්ෂණ වාරික මුදල් ගිණුමේ හා පොදු තැන්පත් ගිණුමේ පැවති පිළිවෙලින් රු.968,265 ක් හා රු.38,050 ක් වූ බැර ශේෂ හඳුනා ගැනීමට අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම මගින් වැඩිපුර ලැබුණු රක්ෂණ වාරික මුදල් රු. 968,262.00 ක සමුච්චිත අරමුදලට බැර කිරීමට කටයුතු කර ඇත. එමෙන්ම පොදු තැන්පත් ගිණුමේ රු. 38,050 ක බැර ශේෂය 2022 අවසන් ගිණුම් මගින් සමුච්චිත අරමුදලට බැර කිරීමට කටයුතු කරනු ලැබේ. | ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කල යුතුයි. |
| (ඇ) | ප්‍රතිලාභින් 8,166 ක් වෙනුවෙන් සනීපාරක්ෂක පහසුකම් (වැසිකිළි ඉදිකිරීම) සඳහා එක් අයකුට රු. 15,000 බැගින් දෙවන වාරිකය ලෙස රු. 122,490,000 ක් ගෙවිය යුතුව තිබුණද එම මුදල උපචිත වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණෙන් මෙහෙයුම් ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණු අතර ජංගම වගකීම් ද එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | සනීපාරක්ෂක ව්‍යාපෘති එක් වසරක් තුල නිම කිරීමට සැලසුම් කර නොමැති බැවින් දෙවන වාරිකය ලෙස ගෙවීමට තිබූ ඉතිරි මුදල් 2020 වර්ෂයේ උපචිත වියදම් ලෙස ගිණුම්ගත කර නොමැත. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | අමාත්‍යාංශයෙන් ලැබුණු විදුලි ජනක උපකරණ 2 ක් නිලාවෙළි පුහුණු මධ්‍යස්ථානයට ලබා දී තිබුණද එම පරිත්‍යාගය ගණනය කර ගිණුම්වලට ගෙන නොතිබුණි. | අමාත්‍යාංශයෙන් ලැබී ඇති විදුලි ජනක යන්ත්‍රය නිලාවෙළි පුහුණු මධ්‍යස්ථානයට ලබාදී එහි අළුත්වැඩියා කටයුතු අවසන් කර භාවිතයට ගැනීම සඳහා සූදානම් කරමින් පවතින අතර ඉදිරියේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | එකතුව රු.11,031,770 ක් වූ ගිණුම් විෂයයන් 3 කට අදාළව උපලේඛන හා ශේෂ සනාථ කිරීම් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | 2014 වර්ෂයේ අවසානය දක්වා සමෘද්ධි නිලධාරී යතුරුපැදි ණය අරමුදලින් සමාජ ආරක්ෂණ අරමුදලට බැර කරන ලද රු. 8,664,920.00 ක මුදල 2021 වර්ෂයේ අවසන් ගිණුම මගින් සමුච්චිත අරමුදලට බැරකර පෙන්නුම් කිරීමට කටයුතු කර ඇත. වර්ගීකරණය නොකරන ලද කාර්යාල උපකරණ ආරම්භක ශේෂයන් ඉදිරියේදී නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | අදාළ උපලේඛන හා ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර වත්කම්වල නිවැරදිතාවය සනාථ කර ගැනීමට කටයුතු කර නොතිබුණි | සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදලේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු මේ දක්වා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ සිදුකර ඇත. චක්‍රලේඛ ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ කටයුතු ඉදිරියේදී සිදු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | චක්‍රලේඛ හා විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු. 641,568,935 ක ඌණතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 1,450,588,357 විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු 2,092,157,292 ක පිරිහීමට සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ ක්‍රියාකාරකම්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදලේ භාර ඔප්පුවේ 6(9) ඡේදය ප්‍රකාරව මණ්ඩලයේ කිසිදු සාමාජිකයෙකු විසින් සිදුකරන ලද ප්‍රත්‍ය උපකාරයක් වෙනුවෙන් වැටුපක්, දීමනාවක් හෝ ප්‍රසාද දීමනාවක් හිමි නොවන බව දක්වා තිබියදීත් සමෘද්ධි දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා නිලබලයෙන් භාර අරමුදලේ සභාපති ලෙස කටයුතු කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ වැඩබැලීමේ වැටුප් ලෙස රු. 242,000 ක් ගෙවා තිබුණි. | සමාජ ආරක්ෂණ හා සුභසාධන අංශයේ වැඩබලන අධ්‍යක්ෂවරයා සමාජ ආරක්ෂණ අරමුදලේද කටයුතු කරන අතර එය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ හා භාරකාර මණ්ඩලයේ අනුමැතීන් මත සිදුකර ඇත. | සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදලේ භාර ඔප්පුවේ 6(9) ඡේදය ප්‍රකාරව කටයුතු කල යුතුයි. |
| (ආ) | සමෘද්ධිලාභී හා අඩු ආදායම්ලාභී පවුල් සඳහා සනීපාරක්ෂක වැසිකිලි 39,478 ක් ඉදිකිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ රු. 930,840,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට වැසිකිලි 35,111 ක් සඳහා මුදල් ලබා දී තිබුණද වැඩ නිමකල වැසිකිලි සංඛ්‍යාව 21,091 ක් හෙවත් සියයට 60 ක් විය. නියමු ව්‍යාපෘතියක් ලෙස රත්නපුර දිස්ත්‍රික්කය තෝරාගෙන වැසිකිලි 11,137 ක් ඉදිකිරීමට අනුමත කර තිබුණු අතර ඉන් වැසිකිලි 1,613 ක් හෙවත් සියයට 15 ක පමණක් වැඩ නිමකර තිබුණි. ප්‍රතිලාභී කළමනාකරණ මොඩියුලය (CRM) අනුව පරීක්ෂා කිරීමේදී ප්‍රතිලාභ ලබාගත් 13 දෙනෙකු සමෘද්ධිලාභී හා අඩු ආදායම්ලාභීන් නොවන බව නිරීක්ෂණය විය. | 2021 වර්ෂයේ මුල් මාස කිහිපය තුළ මෙම ඉදිකිරීම් සියල්ලම ඉදි කර අවසන් කර ඇත. රත්නපුර දිස්ත්‍රික්කයේ ඉදි කිරීමට අනුමතව තිබූ සනීපාරක්ෂක වැසිකිලි 11,137 ක ඉදි කිරීම් කටයුතු 2021 වර්ෂයේ මුල් මාස කිහිපය තුළ අවසන් කර ඇත. ප්‍රතිලාභ ලබාගත් 13 දෙනෙකු සමෘද්ධිලාභී හා අඩු ආදායම්ලාභීන් නොවීම සම්බන්ධයෙන් කරුණු සොයා බලා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන ලෙස අදාල අංශයන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත | නියමිත කාලයන් තුල ව්‍යාපෘති නිම කර ප්‍රතිපාදිත මුදලින් උපරිම ප්‍රතිලාභ ලබාගත යුතුයි. අඩු ආදායම්ලාභීන්ද සමෘද්ධිලාභීන්ද යන්න සනාථ කර ප්‍රතිලාභ ලබාදිය යුතුයි. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදය මගින් ස්ථාපිත කර තිබුණු මුදල් රෙගුලාසි 877(2) ප්‍රකාරව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී මාස 02 ක් තුළ කාර්යසාධන වාර්තාවක්ද සමඟ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වසර 02 ක ප්‍රමාදයකින් පසුව 2022 දෙසැම්බර් 16 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි. | 2018, 2019 සහ 2020 වර්ෂවල අවසන් ගිණුම් 2022 මාර්තු 09 වන දින රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව අදාළ කාලය තුළ ගිණුම් ඉදිරිපත් කළ යුතුය. |

### 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදයේ ඇතුලත් මුදල් රෙගුලාසි 877(1) ප්‍රකාරව අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | 2022 වර්ෂයේ සමාජ සංවර්ධන භාරකාර අරමුදලේ අය වැය ලේඛනය පිළියෙල කර ඇත. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව අදාළ කාලය තුළ ලේඛනය සකස් කර ඉදිරිපත් කළ යුතුය. |